දිවිනැගුම/දෙ/ප්‍ර.කා/
පා/ චක්‍රලේඛ

2014.04.

**<u>අභ්‍යන්තර චක්‍රලේඛ අංක 2014/01</u>**

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - කළාප අංක 01
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - කළාප අංක 02
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - කළාප අංක 03
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - කළාප අංක 04
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - කළාප අංක 05
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - කළාප අංක 06

**<u>2013 අංක 01 දරණ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තු පනත යටතේ එම දෙපාර්තමේන්තුවට ඇතුළත් වන නිලධාරින් සඳහා වන කැමැත්ත ප්‍රකාශ කිරීමේ අවස්ථා ලබාදීම.</u>**

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම මත ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ හා ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ හා ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ සේවකයින් සඳහා 2013අංක 01 දරණ පාර්ලිමේන්තු පනතින් හා 2014/04/03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ 14/0430/519/006 අංක දරණ තීරණ ප්‍රකාරව පහත සඳහන් යෝජනා අතුරින් තමාගේ කැමැත්ත පරිදි තෝරා ගන්නා යෝජනාව අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට එක්වීමට හා ඉවත් වීමට අවස්ථාව සලසා දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් ඔබ කළාපයට අයත් දිස්ත්‍රික්කවල සේවය කරන සියළුම නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

## ***<u>01. ස්වකැමැත්තෙන් සේවයෙන් ඉවත්වීම.</u>***

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයට බැඳීමට කැමැත්ත පල නොකර ස්වකැමැත්තෙන් සේවයෙන් ඉවත්ව යෑමට කැමැත්ත පලකරන අවස්ථාවකදී අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය යුතු ස්වකැමැත්තෙන් සේවයෙන් ඉවත්ව යෑමේ වන්දි සැලැස්මේ නියම ප්‍රකාර යම් වන්දි මුදලක් ඒ නිලධාරියා හෝ සේවකයා වෙත ගෙවනු ලැබිය යුතුය.

2014.04.03 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ අංක 14/0430/519/006 තීරණ ප්‍රකාරව ඇතුළත් ස්වේච්ඡාවෙන් විශ්‍රාම යෑමේ යෝජනා ක්‍රමය යටතේ හිමිකම් ප්‍රදානය වන ආකාරය පහත පරිදි වේ.

**දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම මත විශ්‍රාම යැමට අපේක්ෂිත, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ සහ ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ සේවකයින් සඳහා වන ස්වේච්ඡාවෙන් විශ්‍රාම යැමේ යෝජනා ක්‍රමය :**

**1.** **<u>මෙම ස්වේච්ඡාවෙන් විශ්‍රාම යැමේ යෝජනා ක්‍රමය යටතේ අයදුම් කිරීමට සුදුසුකම් ලබන්නෝ,</u>**

1.1 දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන දිනට පෙර දින හෝ ඊට පෙර වයස අවුරුදු 55 සම්පූර්ණ නොකරන්නා වූද, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ හා ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ සේවයේ ස්ථිර කර ඇත්තාවූ ද සේවකයින්.

1.2 දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන දිනට පෙර දින හෝ ඊට පෙර වයස අවුරුදු 55 ට එළඹී ඇති ස්ථිර සේවකයින්.

1.3 ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ හා ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ අනියම්/ කොන්ත්‍රාත්/ ආදේශක සේවකයින්.

**2.** **<u>ඉහත 1.1 ගණය යටතේ ගැනෙන සේවකයින් සඳහා ගෙවන වන්දිය.</u>**

| | | |
|---|---|---|
| **(අ) පෙර සේවය** | **:** | **සෑම මාස 12 ක සේවා කාලයක් සඳහා මාස දෙකක (02) වැටුප** |
| **(ආ) අභිමි වන සේවය** | **:** | **සෑම මාස 12 ක සේවා කාලයක් සඳහා මාසයක (01) වැටුප** |

**(ඇ) උපරිම වන්දිය රුපියල් 1,000,000/= කි.**

**3.** **<u>ඉහත 1.2 ගණය යටතේ ගැනෙන සේවකයින් සඳහා ගෙවන වන්දිය.</u>**

මෙම ගණය යටතේ ගැනෙන සේවකයෝ, ඉහත 02 (ඇ) ගණය යටතේ දක්වා ඇති උපරිමයට යටත්ව, වයස අවුරුදු 60 දක්වා, සෑම මාස 12 කටම මාස එකක (01) වැටුප යන පදනම මත, අභිමි වන සේවා කාලය වෙනුවෙන් පමණක් වන්දි ලැබීමට සුදුසුකම් ලබති.

**4.** **<u>ඉහත 1.3 ගණය යටතේ ගැනෙන, අනියම්/ කොන්ත්‍රාත්/ ආදේශක සේවකයින්ට ගෙවන වන්දිය.</u>**

(I) **දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කෙරෙන දින ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය නොවී, ඉහත සඳහන් අධිකාරී තුනෙහි දින 180 ක සේවය සම්පූර්ණ කොට සේවයෙහි නියැළී සිටින්නන්.**

(අ) පෙර සේවයේ සෑම මාස දොළසකටම (12) මාස දෙකක (02) ක වැටුප.
(ආ) උපරිම වන්දිය- මාස දොළසක (12) වැටුප.
(ඇ) වන්දිය ගණනය කිරීමේ සූත්‍රය.
(22 x දෛනික වැටුප x මාස ගණන)

## 5. ඉහත **1.1** හා **1.2** ගණ යටතේ ගැනෙන්නන්ට අදාල වන කොන්දේසි.

(අ). වන්දි ගෙවීමේ කටයුතු සඳහා අදාල වන අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 60 සේ සැලකේ.

(ආ) විශ්‍රාම යන අවස්ථාවෙහි ලබන්නා වූ මූලික ඒකාබද්ධ මාසික වැටුප පදනම් කොටගෙන වන්දිය ගණනය කෙරේ. (අතුරු දීමනා නොසලකා)

(ඇ) වන්දියට අමතරව, අදාල පනත්වල නීතිරීතිවලට ප්‍රකාර සියළුම ව්‍යවස්ථායීය ගෙවීම් කෙරෙනු ඇත.

(ඈ) විනය පරීක්ෂණයකට යටත්ව සිටින්නා වූ හෝ කිසියම් උසාවියකින් විනිශ්චය විය යුතුව ඇති ස්ථිත්‍යයකින් යුත් සේවකයින් මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ සඳහා සුදුසුකම් නොලබති.

(ඉ) විදේශගත රැකියා හෝ අධ්‍යයන කටයුතු සඳහා ලබාගත් වැටුප් රහිත නිවාඩු, වෛද්‍ය හේතුන් මත ලබාගත් විශේෂ නිවාඩු, ද්විතීයනය පදනම මත වෙනත් ආයතනවල හෝ මුදා හැරීම් මත වෙනත් රාජ්‍ය ආයතනවල සේවා කාලයන් වන්දි ගෙවීමේ කාර්ය සඳහා සැලකිල්ලට නොගැනේ.

(ඊ) ගෙවීමට ඇති ණය මුදල්, අත්තිකාරම් හා අයවිය යුතුව ඇති වෙනත් මුදල්, වන්දි මුදලින් අඩු කෙරෙනු ඇත.

(උ) මෙම ප්‍රතිලාභ ලබා සේවයෙන් විශ්‍රාම යන්නන් කිසිම හේතුවක් නිසාවත්, රාජ්‍ය සංස්ථා, ස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම් ඇතුළු රාජ්‍ය අංශයෙහි සේවය සඳහා නැවත එක් වීමට හිමිකම් නොලබති.

6. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වන, සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ හා උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ගත සේවාවන් හි නිලධාරින්ගේ නව සේවා කොන්දේසි, ස්වකීය දෙපාර්තමේන්තුවල දැනට පවත්නා සේවා කොන්දේසි හා නොගැලපෙන අවස්ථාවන්හිදී විශ්‍රාම යාම සඳහා ඔවුන් විසින් කෙරෙන ඉල්ලීම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 02 හා 07 වන වගන්ති ප්‍රකාර සැලකිල්ලට භාජනය කෙරෙනු ඇත.

7. යථෝක්ත "අධිකාරි" තුනෙහි, ද්විතීයනය පදනම මත සේවය කරන්නා වූ දීප ව්‍යාප්ත සේවාවන් හි හා ඒකාබද්ධ සේවයෙහි සේවකයින් හෝ යථෝක්ත රජයේ දෙපාර්තමේන්තු දෙකෙහි සේවය කරන්නා වූ සේවකයින් මෙම ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමයෙන් ආවරණය නොකෙරේ.

මෙම ක්‍රමය යටතේ සේවයෙන් ඉවත්ව යන සේවකයින් සඳහා තමන් පෙර සේවයේදී දායකත්වය දරණ ලද ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා හිමිකම් ලබනු ඇත. (සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල, පාරිතෝෂික දීමනාව)

## ***02. මුල් සේවා කාලය සමඟ විශ්‍රාම වැටුප් සහිත සේවකයෙකු වීම.***

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවයට එක්වීමට කැමැත්ත පලකරන අවස්ථාවකදී අදාල අධිකාරිය තුළ යම් තනතුරකට පත්කරන ලද දින සිට බලාත්මක වන පරිදි දෙපාර්තමේන්තුවේ සේවයට බැඳීමට ඒ නිලධාරියා හෝ සේවකයා කැමැත්ත පලකරන අවස්ථාවකදී ඒ නිලධාරියා හෝ සේවකයා අදාල අධිකාරිය තුළ ඒ තනතුරට පත්කරන ලද දින සිට බලාත්මක වන පරිදි සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු හෝ සේවකයෙකු ලෙස සලකනු ලබන අතර, අදාල අධිකාරිය විසින් සේවක අර්ථසාධක අරමුදලට ලබාදෙන ලද දායකත්වය සැලකිල්ලට ගෙන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ විශ්‍රාම වැටුපක් සඳහා ඒ නිලධාරියා හෝ සේවකයා හිමිකම් ලබනු ඇත.

මෙම ක්‍රමය යටතේ සේවයට බැඳෙන එක් එක් නිලධාරියා වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදලේ පවත්නා සම්පූර්ණ දායකත්වයෙන් 60% ප්‍රමාණය රජයට හිමිවනු ඇත. සේවකයාගේ දායකත්වය වශයෙන් පවත්නා 40% ඔහුට ආපසු ලබාගත හැකි වනු ඇත. එහෙත් තමාගේ දායකත්ව අරමුදලෙන් මුල් සේවා කාලයේ සිට විශ්‍රාම වැටුප් සහිත සේවකයෙකු වන බැවින් වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු විශ්‍රාම වැටුපට දායක වීම අනිවාර්ය වන අතර ඔවුන් විසින් එම දායකත්වය ලබා ගන්නා දිනය අනුව ගෙවිය යුතු යම් හිඟ දායක මුදලක් හෝ පොළී මුදලක් වන්නේ නම් එම අරමුදලේ සාමාජිකත්ව ලබා ගන්නා දින සිටම එය ගෙවා නිම කල යුතුය. එසේම මෙම ක්‍රමය යටතේ බැඳෙන සේවකයන් වෙනුවෙන් අදාල ව්‍යවස්ථාපිත මණ්ඩලය විසින් සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට කරන ලද දායකත්වය එම සේවකයන්ට ලබාගත හැකි වනු ඇත. එසේ වුවද පාරිතෝෂික පනත යටතේ වන පාරිතෝෂිකය ලබාගැනීමට හිමිකම් නොලබනු ඇත.

## ***03. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවන දින සිට විශ්‍රාම වැටුප් සහිත සේවකයෙකු වීම.***

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වන දින සිට එනම් (2014.01.03 දින සිට) විශ්‍රාම වැටුප් සහිත දෙපාර්තමේන්තු ගත සේවකයෙකු වශයෙන් බැඳීමට කැමැත්ත පලකරන නිලධාරියෙකුට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව ඒ නිලධාරියාට හෝ සේවකයාට දෙපාර්තමේන්තු සේවයට බැඳිය හැකියි. දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුනු දින සිට ඒ නිලධාරියා හෝ සේවකයා දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු හෝ සේවකයෙකු ලෙස සලකනු ලැබේ. එසේම විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා වන දිනය ලෙස ඒ නිලධාරියා හෝ සේවකයා සේවයට බැඳුනු දිනය ගණන් ගනු ලැබේ. **(මෙම ක්‍රමය යටතේ යම් සේවකයෙකු අළුතෙන් සේවයට එකතු වන අවස්ථාවකදී එම සේවකයා අයත් සේවා ගණයේ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවරේ පිහිටවනු ලැබේ).**

මෙම ක්‍රමය යටතේ සේවයට බැඳෙන නිලධාරියා හෝ සේවකයාට 1958 අංක 15 දරණ සේවක අර්ථ සාධක අරමුදල් පනත යටතේ දායකත්වය ලබාදී ඇති අරමුදල් ලබාගැනීමට සුදුසුකම් ලබයි. එසේම 1980 අංක 46 දරණ සේවා නියුක්තියන්ගේ භාර අරමුදලේ දායකත්ව මුදල් ලබාගැනීමට සුදුසුකම් ලබන අතර, පාරිතෝෂික දීමනාව මුදල ලබාගැනීමට ද හිමිකම් ලැබෙනු ඇත.

***04. තවදුරටත් සේවක අර්ථසාධක අරමුදලේ හා සේවා නියුක්තියන්ගේ භාර අරමුදලේ සාමාජිකත්වය යටතේ විශ්‍රාම වැටුප් රහිත සේවකයෙකු වීම.***

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වුවද, දෙපාර්තමේන්තු සේවයට යාමට කැමැත්ත පල නොකර තව දුරටත් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට අඛණ්ඩව දායක වීමට කැමැත්ත පලකරන අවස්ථාවකදී ඒ නිලධාරියා හෝ සේවකයා නියමිත දින සිට බලාත්මක වන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු හෝ සේවකයෙකු ලෙස සලකනු ලබන අතර, එකී අරමුදල් සඳහා අඛණ්ඩව දායක මුදල් ගෙවිය යුතුය. එසේ වුවද ඒ නිලධාරියා හෝ සේවකයා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් නොලබනු ඇත.

**05. ඒ අනුව මේ සමඟ අමුණා ඇති පිටපත් 04 කින් යුත් මනාපය පල කිරීමේ ප්‍රකාශය සියළු නිලධාරීන් මගින් සම්පූර්ණ කර, 2014 මැයි මස 16 වන දිනට පෙර ඔබ වෙත ලබාගැනීමට කටයුතු කරන මෙන් කාරුණිකව දැනුම් දෙමි. මෙය ප්‍රමුඛ කාර්යක් සේ සලකා කටයුතු කරන ලෙසට ද වැඩිදුරටත් දන්වා සිටිමි.**

ආර්.ඒ.ඒ.කේ. රණවක,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් :-

| | | | |
|---|---|---|---|
| 01. | ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.ස. |
| 02. | ලේකම්, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.ස. |
| 03. | අධ්‍යක්ෂ (මානව සම්පත්) | - | අ.ක.ස. |
| 04. | විගණකාධිපති | - | දැ.ගැ.ස. |
| 05. | ප්‍රධාන ගණකාධිකාරී | - | දැ.ගැ.ස. |